දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 784807 784832

ලේකම් / செயலாளர் / Secretary } 784811

කාර්යාලය / அலுவலகம் / Office } 785141-50 Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு

Ministry of Human Resource Development, Education & Cultural Affairs

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල

'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல.

"Isurupaya", Sri Jayawardhanapura Kotte. Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ....................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/10/01/24/01

වක්‍රලේඛ අංක : 2004/09

දිනය / திகதி / Date } 2004 .03. 10

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

## ගාස්තු අය නොකරන ආධාර ලබන පෞද්ගලික පාසල් හා විශේෂිත පාසල්වල සේවය කරන ගුරුවරුන් පෞද්ගලික පාසල් ගුරු සේවා නියෝග මාලාව අනුව එම ගුරු සේවාවේ උසස්වීම් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද මාගේ අංක 4/ගුරු ආ/3099/99/විවිධ හා 1999.11.14 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශය වක්‍රලේඛ අංක 1999/49 දරණ වක්‍රලේඛය හා බැදේ. එම වක්‍රලේඛයේ 6 වැනි ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එහි සඳහන් පරිදි ව්‍යවස්ථානුකූල උසස්වීම් සම්බන්ධයෙන් එකී නියෝග මාලාවට අනුකූලව මෙම වක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

02. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව අනුව රජයේ පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ උසස්වීම් ක්‍රියාත්මක කල ආකාරයට, ගාස්තු අය නොකරන, ආධාර ලබන පෞද්ගලික පාසල්වල හා විශේෂිත පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ ද උසස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2004-01-08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 03/1528/128/070/ඒපීසී/514 අනුව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. එම තීරණය පදනම් කරගෙන ගාස්තු අය නොකරන, ආධාර ලබන පෞද්ගලික පාසල් ගුරු සේවා නියෝග මාලාව, සංශෝධනය කර ඇති අතර ඒ අනුව එම ගුරුවරුන් සුදුසුකම් ලබා ඇති පන්තියට/ශ්‍රේණියට උසස්වීම් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇත.

<u>සංශෝධන</u>

1999-11-14 දිනැති ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවා නියෝග මාලාවේ 11 වන කොටසේ 03:2 උප වගන්තිය ඉවත් කර පහත සඳහන් ජේදය එක් කරනු ලැබේ.

03:2 පන්ති/ ශ්‍රේණි ක්‍රමයේ ගුරුවරුන්ට උසස්වීම් සඳහා ලකුණු රැස්කර ගත හැකි ආකාරය පහත දැක්වේ.

පැහැදිලි කිරීම් (උසස් කිරීමේ ලකුණු ක්‍රමය)

ඉහත නව විධිවිධාන පදනම් කරගෙන ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ ගුරුවරුන් ඔවුන් සුදුසුකම් ලබා ඇති ශ්‍රේණියට/පන්තියට උසස් කිරීම් සඳහා ලකුණු උපයා ගත හැකි ආකාරය පහත සඳහන් වේ.

(i.) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 3:I ශ්‍රේණියේ පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරී (ප්‍රායෝගික පුහුණු සහිතව) හා උපාධිධාරී (වෘත්තිය සුදුසුකම් රහිත) වර්ග තුනට අයත් ගුරුවරුන් විසින් එම ශ්‍රේණියේදී ලකුණු 05 ක් උපයා ගැනිමෙන් ද ,

(ii.) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරී (ප්‍රායෝගික පුහුණුව සහිත) හා වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරී යන ගුරුවරුන් විසින් එම ශ්‍රේණියේ දී ලකුණු 10 ක් උපයා ගැනිමෙන්ද,

(iii.) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරී (ප්‍රායෝගික පුහුණුව සහිත) සහ වෘත්තිය සුදුසුකම් සහිත යන උපාධිධාරී ගුරුවරුන් හා ඒ සමාන සුදුසුකම්ලත් ගුරුවරුන් එම ශ්‍රේණියේදී ලකුණු 05 ක් ද උපයා ගැනිමෙන් පසුව ඔවුනට ඊළඟ ශ්‍රේණියට උසස්වීම් සඳහා සුදුසුකම් ලැබේ.

06. ගුරු සේවා නියෝග මාලාවේ II වන කොටසේ 03:02 උපවගන්තිය සංශෝධනය වීම අනුව ගුරුවරුන්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය ලකුණු පහත දැක්වෙන ආකාරයෙන් උපයාගත හැකි වේ.

(i.) ස්ථිර සේවයේ සෑම පුහුණු, පුහුණු ඩිප්ලෝමා නුපුහුණු උපාධි හා වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරී ගුරුවරයෙකුටම සිය සේවා කාලයේ එක් අවුරුද්දකට එකක් බැගින් ලැබෙන ලකුණු ද,

(ii.) පුහුණු ගුරුවරුන්ගේ පුහුණු සහතිකය වලංගු දිනට පෙර ස්ථිර සේවා කාලයේ ගුරු විද්‍යාල පුහුණු කාලයද ඇතුලත් වන සේ අවුරුදු දෙකකට එක ලකුණක් බැගින් ලැබෙන ලකුණු ද,

(iii.) උපාධි ගුරුවරුන්ගේ උපාධි පත්වීමට පෙර ස්ථිර සේවයේ වසර දෙකකට එක ලකුණක් බැගින් ලැබෙන ලකුණු ද,

(iv.) උපාධි ගුරුවරුන් අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්වන්නේ නම් ඒ සඳහා එක වරක් පමණක් ලැබෙන ලකුණක් ද,

යන පිළිවෙලට ලකුණු උපයාගත හැකි වේ. මේ හැරෙන්නට ඉදිරියේ දී පැවැත්වීමට සැලසුම් කර ඇති පරිදි ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 3:I ශ්‍රේණියේ දී පවත්වනු ලබන විභාගය සමත්වන්නේ නම් ලකුණු 3 ක් ද, 2:II වන ශ්‍රේණියේ දී පවත්වනු ලබන විභාග සමත්විමෙන් ලකුණු 5 ක් ද උපයාගත හැකිය.

07. ඉහත සඳහන් ඕනෑම ආකාරයකින් ලබාගන්නා ලකුණු ගුරු සේවයේ උසස්වීම් සඳහා එකතුවක් වශයෙන් යොදා ගත හැකිය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 1 වන පන්තියට උසස් කිරීමේ දී උපාධිධාරී ගුරුවරුන් සම්බන්ධයෙන් ගත් කල ඔවුන් වෘත්තිය සුදුසුකම් ලබා ඇති බවට සෑහීමකට පත්විය යුතුය. වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරියා යනු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අමාත්‍යාංශය විසින් අනුමත ගුරු පුහුණු පාඨමාලාවක් හෝ අධ්‍යාපනවේදී උපාධියක් හෝ දරණ උපාධිධාරීහු වෙති.

08. ඉහත විධිවිධාන අනුව ගුරුවරුන් උසස් කිරීම

ගුරු සේවා නියෝග මාලාව අනුව එක් ශ්‍රේණියක/ පන්තියක සිට තවත් ශ්‍රේණියකට/පන්තියකට ගුරුවරුන් උසස් කරනු ලැබීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) ගුරු සේවා නියෝග මාලාවේ සඳහන් කිසියම් නිශ්චිත සේවා කාලයක් හෝ ලකුණු සංඛ්‍යාවක් උපයාගෙන තිබීම.

(ii.) සේවාස්ථ පුහුණුව පිළිබඳ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම

(iii.) 2 වන පන්තියේ 11 වන ශ්‍රේණියේ සිට 2-1 ශ්‍රේණියටත් 2-1 ශ්‍රේණියේ සිට 1 වන පන්තියටත් උසස්වීම් සඳහා වෘත්තීය සමාලෝචනය පිළිබඳ අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබීම.

ගුරු සේවා නියෝග මාලාව අනුව ඉහත (i) හි සඳහන් පරිදි සේවා කාලය හෝ ලකුණු සංඛ්‍යාව සම්පූර්ණ කර ඇති සියළුම ගුරුවරුන් ඉහත සඳහන් සුදුසුකම් අතරින් (ii) හා (iii) දරණ සුදුසුකම් වලින් 2003.12.31 දක්වා ක්‍රියාත්මක වන සේ නිදහස් කිරීමට තීරණය කර ඇත.

09. ලකුණු උපයා ගැනීම

ලකුණු උපයා ගැනීම සම්බන්ධයෙන් ගුරු සේවා නියෝග මාලාවේ සඳහන් වනුයේ කිසියම් ශ්‍රේණියක සේවා කාලය තුළ කිසියම් ලකුණු ප්‍රමාණයක් උපයා ගත යුතු බවයි. කිසියම් ශ්‍රේණියක සේවා කාලය යනු ගුරු සේවා නියෝග මාලාව අනුව එහි 111 වන කොටසෙහි සඳහන් පරිදි ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කාර්යය සඳහා වූ විධිවිධාන යටතේ ඒ ඒ ගුරුවරයා පත්වීම ලද දින සිට වූ සේවා කාලය ඇතුළත් කොට කරනු ලබන ගණනය කිරීමකින් තීරණය වන සේවා කාලයයි. සේවා කඩවීම් හෝ වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාලසීමාවන් මෙම සේවා කාලයෙන් ඉවත් කරනු ලැබියයුතුය.

උදාහරණයක් වශයෙන් කිසියම් පුහුණු ගුරුවරයෙකු 1994.10.06 දිනට පෙර අවුරුදු 15 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුනේ නම් ඔහු 3-1 ශ්‍රේණියේ අවුරුදු 05 ක සේවා කාලයක් ද, 2-1 ශ්‍රේණියේ අවුරුදු 10 ක සේවා කාලයක් ද සම්පූර්ණ කර ඇතුවා සේ සැලකිය යුතුය. අන්තර්ග්‍රහණය සිදුකල 1994.10.06 දිනට පසුව එම සේවා කාලය සම්පූර්ණ කිරීමක් හෝ ලකුණු උපයා ගැනීමක් මෙමගින් අදහස් නොකෙරේ. 1994. 10.06 දින අන්තර්ග්‍රහණය කරන ලද ගුරුවරුන් වර්ෂ 10 ක සේවා කාලයක් සපුරනුයේ 2004.10.06 දිනය යන්න ඒ අනුව නිවැරදි නොවේ.

10. 3-1 ශ්‍රේණියේ සිට 2-11 ශ්‍රේණියට පත් කිරීම

3-1 ශ්‍රේණියේ දැනට සිටින පුහුණු ගුරුවරුන් අතරින් ලකුණු 05 ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති පුහුණු ගුරුවරුන් 2-11 ශ්‍රේණියට උසස් කිරීම නිවැරදිය. මෙය පුහුණු ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ට ද අදාල වේ. දැනට උපාධිධාරීන් ලෙස 3-1 ශ්‍රේණියේ සේවය කරන ගුරුවරුන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්ව සිටී නම් ඊට හිමි සහතිකය වලංගු දිනයේ සිට ද, ඉදිරියේදී උපාධිධාරීන් ලෙස 3-1 ශ්‍රේණියට බඳවා ගනු ලබන ගුරුවරුන් අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්වීමෙන් පසුව ද, උපාධිධාරීන් ලෙස 3-1 ශ්‍රේණියට පත්වීමක් ලබන අය ගුරු සේවා නියෝග අනුව වසර 5 (ලකුණු 05) සම්පූර්ණ කිරීමෙන් පසුව ද 2-11 ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් ලබයි.

11. <u>2-II ශ්‍රේණියේ සිට 2-1 ශ්‍රේණියට උසස් කිරීම</u>

ගුරු සේවා නියෝග මාලාව අනුව සේවා කාලය හෝ ලකුණු ප්‍රමාණය උපයාගෙන ඇති ගුරුවරුන් 2003.12.31 දින දක්වා වෘත්තිය සමාලෝචනය සහ සේවාස්ථ පුහුණුව හෝ ප්‍රතිපුහුණුව පිළිබඳ වූ පූර්ව අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති බැවින්, මෙම ගණයට වැටෙන ගුරුවරුන් 2-1 ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් ලබයි. ඔවුන් ඉහත සඳහන් දින දක්වා වෘත්තිය සමාලෝචනය, සේවාස්ථ පුහුණුව හෝ නැවත පුහුණුව යන අවශ්‍යතාවයන්ගෙන් නිදහස් වූ සේ සැලකිය යුතුය.

12. <u>2-1 ශ්‍රේණියේ සිට 1 වන පන්තියට උසස් කිරීම</u>

ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ 2-1 ශ්‍රේණියේ 2000.12.31 දින හෝ ඊට පෙර වයස අවුරුදු 50 සම්පූර්ණ වූ පුහුණු, පුහුණු ඩිප්ලෝමා සහ වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරී ගුරුවරුන් හා ඒ හා සමාන සුදුසුකම් ලත් ගුරු භවතුන් එම සේවයේ 1 වන පන්තියට උසස්වීම් සඳහා අවශ්‍ය වන සේවා කාලය හෝ ලකුණු ප්‍රමාණය 2000.12.31 දින හෝ ඊට පෙර දක්වා උපයාගෙන ඇත්නම් එකී 1 වන පන්තියට උසස් කරනු ලැබීමට සුදුසු වෙති. ඔවුන් ද ඉහත සඳහන් දින දක්වා වෘත්තිය සමාලෝචනය හා සේවාස්ථ පුහුණු හා කඩඉම් විභාගය සමත්වීමේ යන අවශ්‍යතාවයන්ගෙන් නිදහස් වූ සේ සැලකිය යුතුය.

2001.01.01 දින සිට ශ්‍රී ලංකා පෞද්ගලික ගුරු සේවා නියෝග මාලාව අනුව 2 පන්තියේ 1 ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසකම්ලත් ගුරු භවතුන් 1 පන්තියට උසස් කිරීම සඳහා 2 වන පන්තියේ 1 ශ්‍රේණියේ දී උපයා ගන්නා ලද ලකුණු 5 ක් වෘත්තිය සමාලෝචනය, සේවාස්ථ පුහුණුව හා ඊට අමතරව කඩඉම් විභාගයෙන් ද සමත් විය යුතුය.

සේවයේ 2 වන පන්තියේ 1 වන ශ්‍රේණියේ ගුරුවරුන්, 1 පන්තියට උසස් කිරීම සඳහා කඩඉම් විභාගයෙන් සමත්වීමේ අවශ්‍යතාවය 2001.01.01 දින සිට නිදහස් කර නොමැති නිසා අනෙකුත් අවශ්‍යතාව සම්පූර්ණ කරන ලද ගුරුවරුන්ට 1 වන පන්තියට උසස්වීම සඳහා මෙම චක්‍රලේඛ යටතේ අවකාශ නොමැත. එහෙත් ඉදිරියේදී පැවැත්වීමට නියමිත 2 වන පංතියේ 1 ශ්‍රේණියේ ගුරුවරුන් 1 පන්තියට උසස් කිරීම සඳහා වන කඩඉම් පරීක්ෂණය සමත්වන ගුරුවරුන් 1 පන්තියට උසස්වීමට අවශ්‍ය ලකුණු උපයා ගත් දිනය 2003.12.31 ට පෙර දිනයක් නම් එදින සිට ක්‍රියාත්මක වන පරිදි සෙසු අවශ්‍යතා නොසලකා 1 පන්තියට උසස්වීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

නමුත් අධ්‍යාපනපති, අධ්‍යාපන දර්ශනපති ශාස්ත්‍රපති (අධ්‍යාපන) යන පශ්චාත් උපාධිධාරී 2 වන පන්තියේ (i) ශ්‍රේණියේදී ගුරුවරුන් 1 පන්තියට උසස් කිරීමේ කඩඉම් විභාගයෙන් ව්‍යවස්ථා විධිවිධාන පරිදි නිදහස් කෙරේ.

ඒ අනුව 2 වන පන්තියේ 1 ශ්‍රේණියේ සිටින අධ්‍යාපනපති, අධ්‍යාපන දර්ශනපති, ශාස්ත්‍රපති (අධ්‍යාපන) යන පශ්චාත් උපාධි ලැබූ ගුරුභවතුන් 2 වන පන්තියේ 1 ශ්‍රේණියේදී ලකුණු 5 ක් ලබා ගන්නා දිනය හා ඉහත පශ්චාත් උපාධි සහතිකය වලංගු වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය, 2003.12.31 දිනට හෝ ඊට පෙර දිනයක් නම් එදින සිට එම ගුරු භවතුන්ට ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවා නියෝග මාලාවේ 1 පන්තියට උසස්වීම් ලබාදිය යුතුයි.

13. 2 වන පන්තියේ (i) වන ශ්‍රේණියේ සිට 1 වන පන්තියට උසස් කරනු ලබන ගුරුවරුන්ට (2000.12.31 හෝ ඊට ප්‍රථම) හැර උසස්වීම් සඳහා සුදුසුකම් ලබන අනිකුත් ගුරුවරුන්ට උසස්වීම් නිමිකර දියයුත්තේ අදාළ සේවාකාලය හෝ ලකුණු ප්‍රමාණය සම්පූර්ණ කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිද්දෙනි. කෙසේ වෙතත් මෙම දිනය 1994.10.06 දිනට පෙරාතුව වූ දිනයක් නොවිය යුතුය.

14. උසස්වීම් සිදු කිරීමෙන් පසුව වැටුප් සකස් කළ යුත්තේ රා.පරි.චක්‍රලේඛ අංක 11/94 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ (vii) වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුවය. 2000.01.01 දිනයෙන් පසු දිනයෙන් පසු දිනක සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් ලබන ගුරුවරුන්ගේ වැටුප් සකස් කළ යුත්තේ 07/2000 දරණ රා.පරි.චි. ලේඛය මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ (vii) වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය අනුවයි.

15. උසස්වීම් හිමිවන දින සිට මේ අනුව වැටුප් සකස් කළ යුතු වන අතර නව වැටුප් පියවර අනුව ගෙවීම් ආරම්භ කළ යුත්තේ 2004.01.01 දින සිටය. කෙසේ වුවද උසස්වීම් හිමිවන දින සිට 2004.01.01 දක්වා වූ කාලය සඳහා ගුරුවරයා විසින් උපයාගන්නා ලද වැටුප් වර්ධකයන්ගේ වාසිය ඔහුට හිමිකර දිය යුතුය.

ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයේ උසස් වීමේ වැටුප් පරිවර්තන කටයුතු අවසන් වූ වහාම 1999.09.01 සිට 2003.12.31 දක්වා එක් එක් ගුරුවරයාට ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය ගණනය කර, එක් එක් පාසල වෙනුවෙන් අවශ්‍ය වන මුදල් ප්‍රමාණය ලැයිස්තුගත කර මා වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කර ප්‍රතිපාදන ලබාගැනීමෙන් අනතුරුව හිඟ මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.

16. 1994.10.06 දින සිට මේ දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ පෞද්ගලික පාසල් ගුරුවරුන් ද මෙම උසස් වීම් වලට හිමිකම් ලබන බැවින්, ඒ අනුව වැටුප් සකස් කර විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට ක්‍රියා කළ යුතුය.

වී.කේ. නානායක්කාර,
ලේකම්,
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

මගේ අංකය - ED/02/30/01/02/07

## ශ්‍රී ලංකා ගාස්තු අය නොකරන, ආධාර ලබන පෞද්ගලික පාසල් ගුරු සේවා නියෝගමාලාව අනුව එම සේවාවට අයත් ගුරුවරුන්ගේ උසස්වීම් ලබා ගැනීමට සපුරාගත යුතු අවශ්‍යතා

| පන්තිය හා ශ්‍රේණිය උසස්වීම් | ගුරු වර්ගය | ලකුණු හෝ සේවා කාලය | ජ්‍යෙෂ්ඨ පුහුණුව | සමාලෝචනය (වෘත්තීය) | වෙනත් |
|---|---|---|---|---|---|
| 3 ii හි ගුරුභවතුන් 3 i ට උසස්වීමට සම්පූර්ණ කළයුතු අවශ්‍යතා | නුපුහුණු | වසර 10(1/8.1.1) | පැය 150 (11/1.1) | හෝ | බාහිර උපාධිය/ගුරු පුහුණුව |
| 3 i ගුරුභවතුන් 2 ii ට උසස්වීමට සම්පූර්ණ කළයුතු අවශ්‍යතා | (A) පුහුණු/ඩිප්ලෝමා හා ඒ හා සමාන සුදුසුකම් ලත් අය | 3 පන්තියේ ලකුණු 5 (11/3.1 අ) | පැය 150 (11/1.2) | - | - |
| | (B) උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් අය | 3 පන්තියේ ලකුණු 5 (11/3.1 අ) | හෝ | | පශ්චාත් උපාධි අධ්‍ය./ඩිප්.(1/8.1.2) |
| 2 ii හි ගුරුභවතුන් 2 i ට උසස්වීමට සම්පූර්ණ කළයුතු අවශ්‍යතා | (A) පුහුණු/ පුහුණු ඩිප්ලෝමා හා ඒ හා සමාන සුදුසුකම්ලත් ගුරුභවතුන් | 2/11 දී ලකුණු 10 (11/3.1 ආ) | සති 06(11/1.3) | වෘත්තිය සමාලෝචනය (1/8.1.3) | - |
| | (B) උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් අය | 2/11 දී ලකුණු 10 (11/3.1 අ) | පැය 150 (11/1.5) | වෘත්තිය සමාලෝචනය (1/8.1.3) | පශ්චාත් උපාධි අධ්‍ය./ඩිප්.(11/1.5) |
| 2 i හි ගුරුභවතුන් 1 වන පන්තියට උසස්වීමට සම්පූර්ණ කළයුතු අවශ්‍යතා | (A) පුහුණු/ පුහුණු ඩිප්ලෝමා හා ඒ හා සමාන සුදුසුකම්ලත් ගුරුභවතුන් | 2/1 දී ලකුණු 5 (11/3.1 ඇ) | පැය 75 (ආසන්න වර්ෂ 5 තුළ) (11/1.7) | වෘත්තිය සමාලෝචනය (1/8.1.4) | කඩඉම් විභාගය (11/6) |
| | (B) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් හා ඒ හා සමාන සුදුසුකම් ලත් අය | 2/1 දී ලකුණු 5 (11/3.1 ඇ) | පැය 75 (11/1.7) | වෘත්තිය සමාලෝචනය (1/8.1.4) (11/7) | කඩඉම් විභාගය (11/6) |

නන්දසේන මුන්ඩිගල
ලේකම්
ගුරු ස්ථාවර කමිටුව
2004.02.11